# ආගමික ස්ත්‍රී විමුක්තිවාදී සංකල්පය හා බුදු සමයේ ස්ත්‍රී විමුක්ති මාර්ගයඃ සංයුත්ත නිකායේ භික්ඛුණී සංයුත්තය ඇසුරෙන් විමර්ශනාත්මක අධ්‍යයනයක්


ඇල්ලේ දමිත

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

elledamitha35@gmail.com



***ප්‍රමුඛ පදඃ*** බුදුදහම, භික්ඛුණී, යථාර්ථය, විමුක්තිය, ස්ත්‍රීවාදය


## 1. හැඳින්වීම

පුරුෂ මූලික සමාජයක ස්ත්‍රීන් යටපත්කොට ඇති ආකාරය පිළිබඳ ඔවුන් දැනුවත් කිරීම අරමුණුකොට ගනිමින් ගොඩනැගුණු දේශපාලන හා න්‍යායාත්මක ධාරාවක් ලෙස නූතන ස්ත්‍රී විමුක්තිවාදය හඳුනාගනී. සමාජයෙහි පවත්නා ස්ත්‍රී පීඩනය, සූරාකෑමට එරෙහිව ස්ත්‍රිය මෙහෙයවීම අරමුණුකොටගත් මෙම ව්‍යාපාරයේ න්‍යායක් ලෙස ''ආගමික ස්ත්‍රීවාදය'' ඉදිරිපත් ව ඇත. මේ ඔස්සේ ''ආගම තුළ නිරූපිත ස්ත්‍රිය'' බෙහෙවින් සංවාදයට බඳුන් වූවකි. ලෝක දාර්ශනික චින්තාවලියේ අග්‍රඵලය වූ බුදු දහමේ ස්ත්‍රිය පිළිබඳ ආකල්පය කෙරෙහි බොහෝ සාකච්ඡා ගොඩනැගී ඇත. ''ස්වාමීනි අපි කාන්තාවන් විෂයයෙහි කෙසේ නම් පිළිපැදිය යුතු වන්නෙමු ද?'' ''ආනන්ද ඔවුන් දෙස නොබලන්න.'' ආදි බෞද්ධ දේශනා සරලාර්ථයෙන් ම ගෙන බුදුන් වහන්සේ ස්ත්‍රී විරෝධියෙකු ලෙස දක්වන්නා වූ මතවාද ද ඉදිරිපත් ව ඇත. එහෙත් භික්ඛුණී සංයුත්තාගත දේශනා පිරික්සීමේ දී බුදුසමයේ කාන්තාව විෂයයෙහි විමුක්තිය ප්‍රදානය වී ඇති බව පැහැදිලි ය. ඒ අනුව බටහිර ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරයෙහි නව ප්‍රවණතාවක් වූ ආගමික ස්ත්‍රීවාදය හා බුදුසමයේ ඉගැන්වීම්වලින් (භික්ඛුණී සංයුත්තය) පැහැදිලි වන ස්ත්‍රි විමුක්තිය පිළිබඳ ආකල්පය අතර ඇති සබඳතා, සමවිසමතා, ගැටුම්කාරි අවස්ථා අධ්‍යයනය මෙම පර්යේෂණයෙන් අපේක්ෂිත ය. මෙහි පර්යේෂණ ගැටලු ලෙස ආගමික ස්ත්‍රීවාදී චින්තනය ඔස්සේ අපේක්ෂිත ස්ත්‍රී විමුක්තියෙහි ස්වභාවය කෙසේ ද? සංයුත්ත නිකායේ භික්ඛුණී සංයුත්තාගත 'විමුක්තිය' එහි ස්වරූපය හා මාර්ගය කෙබඳු ද? හා 'ස්ත්‍රී විමුක්තිය' උදෙසා ආගමික ස්ත්‍රීවාදීන්ගේ සංකල්ප බෞද්ධ ඉගැන්වීම් හා ප්‍රතිපක්ෂ ද? යන ගැටලු මූලික කොටගෙන ඇත. එසේ ම ආගමික ස්ත්‍රීවාදයේ සංකල්ප හා ඒ ඔස්සේ ස්ත්‍රිය විෂයයෙහි ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ අධ්‍යයනය කිරීම හා බුදු දහමේ කාන්තාව පිළිබඳ සැබෑ ආකල්පය භික්ඛුණී සංයුත්තය ඇසුරින් පරික්ෂා කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි.

## 2. සාහිත්‍ය විමර්ශනය

රොස්ලින් ඩෙල්මාර්ගේ **ස්ත්‍රීවාදය යනු කුමක් ද?** යන කෘතියෙන් ස්ත්‍රීවාදී සමාජයෙන් ම ප්‍රශ්න කරමින් එම සංකල්පය පිළිබඳ අදහස්, ස්ත්‍රී වාදයේ ඉතිහාසය, ජනප්‍රියත්වයට පදනම් වූ හේතු හා නව ප්‍රවණතා න්‍යාය ඉදිරිපත් කෙරේ. පර්යේෂණ පත්‍රිකාව සඳහා මෙහි තොරතුරු මූලාශ්‍රය කරගැනීමට අපේක්ෂිත ය. Rita. M. Gross, Buddhism After Patriarchy 'ස්ත්‍රීවාදය' යන බටහිර සංකල්පය බුදු සමය ඇසුරින් පරික්ෂා කෙරේ. මුල් ඉන්දියානු පසුබිම තුළ කාන්තාවගේ තත්ත්වය, ඉන්දියානු මහායාන බුදු දහමේ කාන්තා නිරූපණය හා ටිබෙට් වජ්‍රයාන බුදුසමයේ කාන්තාව, බෞද්ධ කාන්තා වීරවරියන්, බෞද්ධ ස්ත්‍රීවාදයක් ගොඩනැගීම සඳහා සමානාත්මතාව පිළිබඳ බුදුසමයාගත ඉගැන්වීම්, බටහිර ස්ත්‍රී විමුක්තිවාදී න්‍යායන් හා සම්බන්ධකොට ලෞකික විමුක්තියක් අර්ථ දැක්වේ. Paul (2000),

බුදු දහමේ පරමාදර්ශී කාන්තාව පිළිබඳ සාකච්ඡා කරයි. බටහිර ස්ත්‍රීවාදීන් අපේක්ෂිත 'විමුක්තිය' වෙනුවට බුදු සමයේ කාන්තාවගේ තත්ත්වය වඩා යහපත් බව පෙන්නුම් කරයි. 'අමිතාභ' බුදුන් වහන්සේ දුක්ඛිත කාන්තාව පිළිබඳ අනුකම්පා කළ බවත් කාන්තාවන් අමිතාභ බුදුන්ගේ ''පාරාදීසයේ'' උප්පත්තිය ලබන බවත් දැක්වේ. සැබෑ විමුක්තිය පිළිබඳ බුදුසමයාගත දාර්ශනික ඉගැන්වීම් පිළිබඳ පරීක්ෂාවක් මෙහි සිදු වී නොමැත. Mary Wollstonecraft, A Vindication of the Rights of Women යන කෘතිය ස්ත්‍රීවාදී චින්තනයේ ආරම්භක නිදහස් කෘතිය ලෙස පිළිගෙන ඇත. එසේ ම Mary Wollstonecraft පළමු ස්ත්‍රීවාදියා ලෙසත් පිළිගැනේ. 1700 අග භාගයේ දී රචිත මෙම කෘතියෙහි ස්ත්‍රියගේ අප්‍රධානත්වය පිළිබඳ සාකච්ඡා වේ. එසේ ම කාන්තා සමානාත්මතාව සහ ක්‍රමයෙන් කාන්තාව ස්වකීය විමුක්තිය පිණිස පෙරට ඒමේ පසුබිම සැකසුණු ආකාරය සාකච්ඡා වී ඇත.

මැක්මිලන්ගේ Introducing Women's studies කෘතියේ දී කාන්තාව වෙනම ගෙන සාකච්ඡා කිරීමට පදනම් වූ සමාජ පසුබිම පිළිබඳ විමසීමක යෙදී ඇත. පුරුෂයාට සමාජයෙහි අතීතයේ සිට ම කිසියම් වූ සුවිශේෂත්වයක් ප්‍රදානය වීම සහ ස්ත්‍රිය හුදු දරුවන් වදන්නියක්, සුන්දරව සිටින්නියක් වශයෙන් පමණක් පිළිගැනීමට බඳුන් විය. මෙම ඓතිහාසික ක්‍රියාවලිය හරහා ස්ත්‍රියගේ සමාජ භූමිකාව සීමාන්තික හා අප්‍රධාන වූ ආකාරය එහිදී සාකච්ඡා කොට ඇත. මෙම පදනම කාන්තා අධ්‍යයනයක් සකස්වීම සඳහා හේතු වූ බව මෙහි සාකච්ඡා කොට ඇත.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

ස්ත්‍රී විමුක්තිය පිළිබඳ ආගමික ස්ත්‍රීවාදය නම් බටහිර සංකල්පය හා භික්ඛුණී සංයුත්තාගත විමුක්ති මාර්ගය පිළිබඳ මෙම පර්යේෂණය සඳහා පහත සඳහන් මූලාශ්‍රය හා ක්‍රමවේද උපයෝගී කොට ගන්නා ලදි. 'කාන්තා විමුක්තිය' පිළිබඳ ආගමික ස්ත්‍රීවාදයේ දාර්ශනික සංකල්පයන් සහිත කෘති සහ සූත්‍ර පිටකාගත සංයුත්ත නිකායේ භික්ඛුණී සංයුත්තයට මූලිකත්වය දෙමින් සූත්‍ර පිටකය සහ අට්ඨකථා පරිශීලනය මෙහි දී ප්‍රධාන වේ. එසේ ම ද්විතීයික මූලාශ්‍රය ද භාවිත කරන ලදී. ඒ සඳහා පුස්තකාලය පරිහරණය කිරීමත්, අන්තර්ජාල වැනි නූතන තාක්ෂණික ක්‍රම ඔස්සේ දත්ත ගවේෂණය කිරීමත්, මෙම විෂය සම්බන්ධයෙන් ප්‍රාමාණික දැනුමක් සහිත විද්වතුන් සමග සාකච්ඡා කිරීමත් සිදු කරන ලදී. මෙම පර්යේෂණය තර්කානුකූල ව විමර්ශනයකොට යම් සාධාරණ නිගමනයක් ගොඩනගා ගැනීම මෙහි ක්‍රමවේදය විය.

## 4. ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම පර්යේෂණය හරහා ''ආගමික ස්ත්‍රීවාදය'' නම් වූ න්‍යාය හා බුදු සමය කාන්තා විමුක්තිය පිළිබඳ දක්වන්නා වූ ඉගැන්වීම් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට ඇත. ආගමික ස්ත්‍රීවාදීන්, ආගමික මතවාද සම්බන්ධයෙන් දක්වා තිබෙන අදහස් විවාදාපන්න ය. ඔවුන්ගේ අර්ථකථනවලට අනුව ආගමික සම්ප්‍රදායන් හා ආගමික ප්‍රතිපදා හා, ආගමික කෘති යනාදී සියල්ල ස්ත්‍රීවාදී ප්‍රඥප්තියකින් යළි ප්‍රතිසංස්කරණය කළ යුතු ය. පුරුෂාධිපත්‍ය මත පදනම්ව ඇති ආගමික ඉගැන්වීම් බැහැර කරමින් යථාර්ථය වශයෙන් ආගමික කෘත්‍යයන්හි තිබෙන මාතෘත්වය සම්බන්ධ සැබෑ නිරූපණය යළි ස්ථාපිත කළ යුතු ය. ආගමික ඉගැන්වීම් හරහා ස්ත්‍රී විරෝධාකල්ප සමාජගත කොට ඇති බව ස්ත්‍රීවාදින්ගේ මතවාදයකි. බුදු දහම ආශ්‍රයෙන් ද ඒ සඳහා නිදසුන් දැක්වීමට උත්සුක වී ඇත. එහෙත් බුදු දහම තුළ ස්ත්‍රීත්වය සම්බන්ධයෙන් පැහැදිලි අදහසක් ඉදිරිපත් වී ඇත. ඒ අනුව භික්ඛුණී සංයුත්තාගත දේශනාවලින් සනාථ වනුයේ බුදු දහමේ තුළ 'විමුක්තිය' යන්න වචනයකට සීමා නොවී පැහැදිලි මාර්ගයක් සහිත

වී ඉදිරිපත්ව ඇති බවයි. **''අත්‍ථි නිස්සරණං ලොකෙ පඤ්ඤාය මෙ සුඵස්සිතං - පමත්තබන්ධු පාපිම න ත්වං ජානාසි තං පදං''** එකී විමුක්ති මාර්ගය භික්ෂුණීන් වහන්සේලා අවබෝධ කොටගත් ආකාරයත් එම විමුක්ති රසය පිළිබඳවත් මේ අනුව පැහැදිලි ව ප්‍රකාශිත ය. මෙම පර්යේෂණය හරහා ආගමික ස්ත්‍රීවාදය නම් බටහිර සංකල්පයේ අදහස්, එළඹුම්, නිර්දේශ පිළිබඳවත් බුදු දහමේ විමුක්ති මාර්ගයෙහි යථාර්ථවත් බව හා අද්‍යතන සමාජ උපයෝගීතාවය පිළිබඳවත් හඳුනාගත හැකි ය. ඒ අනුව මෙම පර්යේෂණය බුදු දහමේ ස්ත්‍රීත්වය පිළිබඳ සැබෑ ආකල්පය කෙබඳු ස්වරූපයක් ගනී ද යන්න යථාර්ථවාදීව සමාජගත කිරීමට දයක වීමක් ලෙස දැක්විය හැකි ය.

## 5. නිගමන සහ යෝජනා

ආගමික ස්ත්‍රී විමුක්තිවාදය හා බුදුසමයාගත ස්ත්‍රී විමුක්තිය අතර ඇති සමවිසමතා පිළිබඳ පරික්ෂා කරන මෙම අධ්‍යයනයේ දී ආගමික ස්ත්‍රීවාදින්ගේ නිර්දේශ, එළඹුම් පිළිබඳ සාකච්ඡා කොට ඇත. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව ආගම් ඔස්සේ තුළින් තහවුරු කිරීම මූලික සංකල්පයක් විය. එසේ ම එම සමානාත්මතාව හරහා ස්ත්‍රියට විමුක්තිය ලැබෙන්නේ ය යන්න ඔවුන්ගේ පිළිගැනීම විය. බුදුරජාණන් වහන්සේ ස්වකීය විමුක්ති පණිවිඩය දේශනා කිරීමේ දී පුද්ගල වෛමත්තතාව සොයා බැලුවේ ආධ්‍යාත්මික ශක්‍යතාව අනුව මිස වෙනත් කිසිඳු පටු ආකල්පයකින් නොවන බව මෙමඟින් පැහැදිලි ය. එසේ ම විමුක්තිය ලෙස බුදුන් වහන්සේ දේශනා කරන ලද්දේ ලෞකික වූ නිර්දේශයක් නොව සැබෑම විමුක්තියකි. එය ආධ්‍යාත්මික විමුක්තියකි. බෞද්ධ භික්ෂුණීන් වහන්සේලා විසින් තමන් ලද විමුක්තිය පිළිබඳ දේශිත භික්ඛුණී සංයුත්තාගත ප්‍රකාශනවලින් ඒ බව පැහැදිලි ය. මේ අනුව පොදුවේ ආගමික සම්ප්‍රදායන්වලින් සියලු සත්ත්වයන් විෂයයෙහි සමානාත්මතාව ප්‍රදානය කිරීමේ සමාජ අවශ්‍යතාවත් එම විමුක්තිය ආධ්‍යාත්මික වූ විමුක්තියක් වීම වැදගත් බවත් මෙම පර්යේෂණයෙන් යෝජනා කෙරෙයි.

## 6. ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය


අරියදේව හිමි, විලේගොඩ. (2008). *"බුදු දහමෙන් ප්‍රභාවිත කාන්තා විමුක්තිය"* බුදුසරණ. කොළඹ: සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

පෙරේරා, ඉන්ද්‍රාණී. (2006). *කාන්තාව සහ බුදුසමය.* කොළඹ: ගොඩගේ සහ සමාගම.

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. (2006). සංයුක්ත නිකාය iv. නැදිමාල: බු:ජ:මු.

Diana Y, Paul. (2000). Women in Buddhism. Boston :Beacon press.

Kingorova, Kamila. (2008). Buddhism and the Ordination of Women. Boston: Boston Collage press.